# තනතුරු ඇබෑර්තු

## ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය - අනුරාධපුරය

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් 2024.12.30 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය.**

**සුදුසුකම්**

1). අ) සම්මාන සමාර්ථයන් පහක් (05) සහිතව පහත විෂයයන්ද ඇතුලත්ව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී සමත්වී තිබීම.

i. සිංහල /දෙමළ භාෂාව හෝ සාහිත්‍යය

සහ

ii. අංක ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය

හෝ

ආ) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය විෂයයන් හයකින් (06) සමත් වී ඇති, විශ්වවිද්‍යාල ක්ෂේයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවයක් තිබෙන විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ සේවකයෙකු වීම. එසේ සමත් වූ විෂයයන්ට සිංහල/දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය / වාණිජ අංක ගණිතය/ගණිතය ඇතුලත් විය යුතුය.

සහ

2). පොලිසියේ හෝ සන්නද්ධ සේවයේ වසර 05ක සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම හෝ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයක ආරක්ෂක අංශයේ හෝ පිළිගත හැකි ආරක්ෂක සංවිධානයක වසර 05ක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

3). ක්‍රීඩා සඳහා ක්‍රියාකාරීව සහභාගී වී තිබීම අනිවාර්ය වේ.

4). උස - අවම වශයෙන් අඩි 5 අඟල් 4 විය යුතුයි.
පපුව - අවම වශයෙන් අඟල් 34 ක් විය යුතුයි. (සාමාන්‍යය)

5). වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුයි.

**යෝග්‍යතාව**

(අ) ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුයි.

(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි පිරිමි පුද්ගලයෙකු විය යුතුයි.

(ඇ) යහපත් චරිතයකින් යුක්ත විය යුතුයි.

තෝරා ගැනීමේ ක්‍රම වේදය - සම්මුඛ පරීක්ෂණයක් මඟින් වේ.

වැටුප් පරිමාණය - U-MN 1 (III) රු. 30,725-17X300-35,825p.m. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක17/2016 (V) අනුව

**ප්‍රතිලාභ**

- වැටුප්වලට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.
- විශ්වවිද්‍යාල සේවයට බඳවාගනු ලබන අයට විශ්වවිද්‍යාලය මගින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකත්වය ලැබේ. (අර්ථසාධක අරමුදල සඳහා නිලධාරියාගේ වැටුපෙන් 10% ක මුදලක් සහ විශ්වවිද්‍යාලය මගින් 15% ක මුදලක් බැර කෙරේ.) සේවක භාරකාර අරමුදලට 3% ක මුදලක් විශ්වවිද්‍යාලය මගින් බැර කරනු ලැබේ.

**සේවා මුක්ත භටයෙකුට දෙනු ලබන අනුග්‍රහ**

(අ) වයස - සේවා මුක්ත භටයෙකුගේ වයසින් ඔහු නිත්‍ය හමුදාවේ සේවය කළ කාල පරිච්ඡේදය අඩු කල විට, අයදුම් කරන තනතුරකට නියමිත උපරිම වයස් සීමාව තුලට පැමිණීමට ඔහුට හැකි වන්නේ නම් එහි කාල සීමාව ඔහුගේ වයසින් අඩු කිරීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම් - තනතුරකට අදාල බඳවාගැනීමේ පටිපාටියෙහි දක්වා ඇති අවම අධ්‍යාපන සුදුසුකම්වලට පහළින් ඇති ඊළඟ තත්ත්වයන්ට අඩු කිරීම.

(ඇ) කාර්මික සුදුසුකම් - කාර්මික සුදුසුකම් තක්සේරු කරන විට සන්නද්ධ සේවාවල කාර්මික අංශයන්හි සේවය කළ කාලය තුළ ලබාගත් නිපුණත්වය හා පළපුරුද්ද සැලකිල්ලට ගැනීම.

(ඈ) පත් කිරීමේ දී වැටුප - VII වැනි පරිච්ඡේදය විධිවිධාන අදාළ වේ.

සෙ.මී. 23X10 ප්‍රමාණයේ ලිපිනය සහිත, මුද්දර ඇලවූ ලියුම් කවරයක් සහකාර ලේඛකාධිකාරී (ආයතන) වෙත 2024.12.23 දින හෝ ඊට පෙර එවීමෙන් තනතුරට අදාළ අයදුම්පත හා විස්තර ලබාගත හැකි අතර www.busl.ac.lk වෙබ් අඩවියෙන් ද බාගත කරගත හැකිය.

**අයදුම්කරන පිළිවෙළ**

i. සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඊට අදාළ සහතිකවල පිටපත් සමග ලියාපදිංචි තැපැලෙන් සහකාර ලේඛකාධිකාරී (ආයතන) ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය, පුත්තලම් පාර, අනුරාධපුරය යන ලිපිනයට 2024.12.30 දින හෝ ඊට පෙර එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

ii. විශ්වවිද්‍යාල/රජයේ දෙපාර්තමේන්තු/සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනවල සේවයේ නියුතු අය තම අයදුම්පත් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

iii. නියමිත ආකෘතියෙන් ඉදිරිපත් කර නොමැති, අසම්පූර්ණ හා අයදුම්පත් භාරගන්නා දිනයට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

iv. සුදුසුකම්ලත් අපේක්ෂකයින් පමණක් කෙටි ලැයිස්තු ගතකර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතු වේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා භික්ෂු විශ්ව විද්‍යාලය,**
**2024.12.01**